# පුස්තකාල පුවෘත්ති

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

**වෙළුම: 1,** අංක: 1, ජනවාරි - මාර්තු 1973

පටුන


මණ්ඩලයේ පරිපාලන සංවිධානය - 1973

ගරු අධ්‍යාපන ඇමතිතුමන්ගේ පණිවුඩය

මණ්ඩලයේ කටයුතු හා බලතල

සභාපතිතුමාගේ සන්දේශය

මහජන පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙළ - 1973

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිළිගත් පුණ්‍යායතනයක් ලෙස ප්‍රකාශ කිරීම

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවය - ජ්.වී.එස්.ද අල්විස් (පළාත්පාලන කොමසාරිස්තුමා)

පාසැල් පුස්තකාල - ආචාර්ය පී.උඩගම (ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)

ඒකාබද්ධ පුස්තකාලයාධිපති සේවය

පාඨශාලා පුස්තකාල සංවිධානය හා සංවර්ධනය

මහනුවර නියාමක ග්‍රාමීය පුස්තකාල සේවය

සැලකිය යුතු සිද්ධීන් හා කටයුතු

ලංකාවේ පුස්තකාල විද්‍යා අධ්‍යාපනය ගැන අපේක්ෂා - 1973

## ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

## පරිපාලන සංවිධානය - 1973

### මූලස්ථානය

ලිපිනය : 10, වෙල්සි උද්‍යානය, කොළඹ - 3 (ආනන්ද කුමාරස්වාමි මාවත හා කර්නල් ටී.ජී.ජයවර්ධන මාවත ඔස්සේ). දුරකථනය : සභාපති - 24908, අධ්‍යක්ෂ - 24909.

සභාපති : ඩී.මේ.අ.වර්ණසූරිය (ප්‍රධාන විධායක නිලධාරි) ; ලංකා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ : කේ.ඩී.සෝමදාස (මණ්ඩලයේ ලේකම්) ; සහකාර අධ්‍යක්ෂ (පුස්තකාල සේවා) : ඇස්.ඇම්.කමල්දීන් ; සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) : -

### ප්‍රාදේශීය මධ්‍යස්ථානය (මධ්‍යම ලංකා)

ලිපිනය : සිලෝන් ඉන්ෂුවරන්ස් ගොඩනැගිල්ල (1 වැනි මාලය), 23 1/5, දළදා වීදිය, මහනුවර. දුරකථනය : මහනුවර 7582.

දැනට භාරව සිටින නිලධාරි : සහකාර අධ්‍යක්ෂ (පුස්තකාල සේවා) කේ.ඇල්.පණ්ඩිතරත්න මහත්මිය.

### මණ්ඩලයේ කටයුතු හා බලතල

වර්ෂ 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතෙහි 14 වැනි ඡේදයෙහි විස්තර වේ.

### මණ්ඩලය

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සාමාජිකයන් නව දෙනකුගෙන් සමන්විතය. එනම් ; ඩ.මෙ.අ.වර්ණසූරිය මයා සභාපති (විශ්‍රාම ලත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යාපන සැලසුම් අධ්‍යක්ෂ) ; ඩබ්.ඊ.වී.ඇස්. ද අල්විස් මයා (පළාත්පාලන කොමසාරිස්) ; ඩබ්.ඩත්කන් ද අල්විස් මයා (මහ දිසාපති, කොළඹ දිස්ත්‍රික්කය) ; ජේ.ඩබ්.සුබසිංහ මයා (අධිනීතිඥ, රජයේ නීතිඥ, විශ්‍රාම ලත් ශ්‍රී ලංකා සුප්‍රීම් උසාවියේ රෙජිස්ට්‍රාර් තැන) ; ආචාර්ය ආර්.ඒ.එච්.වීරකෝන් මයා (අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය) ; ඇම්.ඇම්. බහාඋද්දීන් මයා (වෙළඳ ව්‍යාපාරික හා සමාජ සේවක) ; ඇස්.යූ.සෝමසේකරම් මයා (විශ්‍රාම ලත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා සමාජ සේවක) ; *යූ.ඩී.අයි.සිරිසේන මයා (නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්) ; එච්.ඒ.අයි.ගුණතිලක මයා (පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය මණ්ඩපය).

ලංකා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ හා මණ්ඩලයේ ලේකම් : කේ.ඩී. සෝමදාස මයා (හිටපු පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය).

(*1971 දෙසැ. 28 දින සිට ආර්.පස්කරලිංගම් මයා වෙනුවට)

අධ්‍යාපන ඇමති ආචාර්ය අල්හාජ්
<u>බදියුද්දීන් මහමූද් මැතිතුමන්ගේ පණිවුඩය.</u>

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ කටයුතු ප්‍රචලිත කිරීමද මෙරට හා පිටරට ඇති පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන් පිළිබඳ ප්‍රවෘත්ති සැපයීමද අරමුණු කොට ගෙන, "පුස්තකාල ප්‍රවෘත්ති" නම් වූ ප්‍රවෘත්ති සංදේශය ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ආරම්භ කරනු ලැබීම ගැන මගේ සතුට ප්‍රකාශ කරමි.

ජාතික සංවර්ධන සැලසුම් සාර්ථක කර ගැනීමට තත්ත්වාවබෝධයකින් යුත් ජනතාවක් උපස්ථම්භක වේ. සියළු ඥාත විෂයයන් ඇළලූ විස්තීරණ වූ පුස්තකාල හා ප්‍රලේඛණ කේන්ද්‍රාවලියකින් සහාය ලැබූ මහජන ප්‍රවෘත්ති මාධ්‍යයක් එබඳු බුද්ධිමත් ජනතාවක් ඇති කිරීමට හා අධ්‍යාපන සේවය තහවුරු කිරීමටද මහත් රුකුලක් වේ.

"පුස්තකාල ප්‍රවෘත්ති" පළ කිරීම වූ කලී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මෙම සේවය ඉටු කිරීම සඳහා ගත්තා ප්‍රයත්නයන් අතුරින්, එක් මගක් යයි මම සලකමි.

මෙයට මම ශුභාශිංසනය කරමි.

අත්සන් කළේ/
බදියුද්දීන් මහමූද්,
අධ්‍යාපන ඇමති.

1973 මාර්තු මස 16 වැනිදා.

## මණ්ඩලයේ කටයුතු හා බලතල.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පහත සඳහන් කටයුතු හා බලතල 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතින් පවරා ඇත:

(අ) සාමාන්‍යයෙන් පුස්තකාල සේවා සංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳ සැලසුම් පිළියෙළ කිරීම සහ එහි ලා සහාය වීම;

(ආ) ලංකා ජාතික පුස්තකාලය පිහිටුවීම හා පවත්වා ගෙන යාම;

(ඇ) මහජන පුස්තකාල සේවා දියුණු කිරීමෙහි හා සංවර්ධන යෙහි ලා උපදෙස් දීම සහ සහාය වීම;

(ඈ) පාඨශාලා පුස්තකාල දියුණු කිරීමෙහි හා සංවර්ධනයෙහි ලා උපදෙස් දීම හා සහාය වීම;

(ඉ) කියවීම් පතපොත පළ කිරීමෙහි හා ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාර නිෂ්පාදනයෙහි ලා උපදෙස් දීම සහ සහාය වීම;

(ඊ) විශ්ව විද්‍යාල පුස්තකාල, කනිෂ්ඨ විශ්ව විද්‍යාල පුස්තකාල, කාර්මික විද්‍යාල පුස්තකාල, ගුරු විද්‍යාල පුස්තකාල, ප්‍රාදේශීය බලමණ්ඩලවල පුස්තකාල සේවා, රජයේ දෙපාර්ත මේන්තු පුස්තකාල සහ වෙනත් විශේෂ පුස්තකාල සම්බන්ධ කිරීමෙහි හා සංවර්ධනය කිරීමෙහි ලා උපදෙස් දීම සහ සහාය වීම;

(උ) පුස්තකාල සේවාවන්හි සේවයේ යොදවනු ලබන තැනැත්තන් සඳහා අඩු ම ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් නියම කිරීමෙහි ලා රජයට උපදෙස් දීම සහ සහාය වීම;

(ඌ) පුස්තකාල අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ සංවර්ධනය දියුණු කිරීම; සහ

(එ) පුස්තකාල සේවා පිළිබඳ සාමාන්‍ය දියුණුව සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් කාර්යයන් කර ගෙන යාම.

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති තුමාගේ සන්දේශය.

ආසියාවේ ජාතික පුස්තකාල සේවා සංවිධානය කිරීම අරමුණු කොට එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික (යුනෙස්කෝ) සංවිධානයේ මෙහෙයවීමෙන් පුස්තකාල විශේෂඥයින්ගේ සම්මේලනයක් ලක් රජයේ පුරෝගාමීත්වය හා සහයෝගය ඇතිව 1967 දෙසැම්බර් මස කොළඹදී පැවැත්විණ. ආසියාවේ පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන්ගේ වර්තමාන තත්ත්වය විමර්ශනය කිරීම, අධ්‍යාපනික සමාජයීය හා ආර්ථික සංවර්ධනයට මෙම සේවාවන්ගෙන් ඇති ප්‍රයෝජන, පුස්තකාල හා ප්‍රලේඛන සේවා සැලසුම් කිරීමේ මූලධර්ම න්‍යායයන් සකස් කිරීම; මෙම මූලධර්ම එකී එකී රටට වෙන් වෙන් වශයෙන් ද සාමූහිකවද යෙදිම කළ හැක්කේ කෙසේ ද යන ආදී කරුණු සාකච්ඡා කිරීම මෙම සම්මේලනයේ පරමාර්ථ විය.

මෙහිදී සම්මත කරගත් සැලසුම් න්‍යායයන් පදනම් කොටගෙන, ලංකාවේ පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන් සංවර්ධනය කිරීම සඳහා එම විශේෂඥයින් විසින් ලක් රජයේ අවධානය පිණිස සැලැස්මක් ඉදිරිපත් කරන ලදී. ( එහි යොමු අංකය: යුනෙස්කෝ වාර්තා: කොම්/සීඇස්/190/6, පැරිසිය 1968 ). පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන් දියුණු කිරීමට අපේක්ෂා කරන ආසියාවේ සෙසු රටවලට ද මෙම සැලැස්ම ආකෘතියක් ලෙස උපයෝගී වෙතැයි මොවිහු සැලකූහ. මෙසේ ඉදිරිපත් කළ සැලැස්ම ලක් රජය පිළිගෙන, ලංකාවේ පුස්තකාල සේවා සංවර්ධනය ක්‍රියාත්මක කිරීමට පදනම් වන අයුරින් වර්ෂ 1970 දී අංක 19 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල ආඥා පනත පැණවීය.

පුස්තකාල කටයුතු හා සම්බන්ධ වූ නොයෙක් ආයතන නියෝජනය කරන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත වූ මණ්ඩලයක් අධ්‍යාපන ඇමතිතුමන් විසින් පත් කරන ලදී. මෙම මණ්ඩලයට පූර්ණකාලීන සභාපතිවරයෙක් සිටී. ලංකා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එහි ලේකම් වේ. මණ්ඩලයේ මූල ස්ථානය කොළඹ පිහිටා තිබේ. මණ්ඩලයෙහි සේවා කටයුතු ව්‍යාප්ත වන ආකාරයට ප්‍රාදේශීය මධ්‍යස්ථානද පිහිටුවනවා ඇත. මේ අනුව පළමු වන ප්‍රාදේශීය මධ්‍ය ස්ථානය 1972 ජනවාරි මාසයේදී මහනුවර පිහිටුවන ලදී.

ජාතික පදනමක් පිට මේ දිවයිනෙහි පුස්තකාල සේවා සංවිධානය කිරීමට පුස්තකාල මණ්ඩලය සංස්ථාපනය කිරීමෙන් රජය මූලික පියවරක් ගෙන ඇත. මෙය, ඇත්ත වශයෙන්, රටෙහි සමාජයීය හා ආර්ථික සැලසුම් ක්‍රමයට ඇතුලත් වූ අධ්‍යාපනික සැලැස්මෙහි එක අවශ්‍ය අංශයෙකි. "පුස්තකාල සේවා අනුසාරයෙන් වෘද්ධ අධ්‍යාපනය ඇතුළු වූ හැම තරාතිරමේ අධ්‍යාපනික හා විද්‍යා පර්යේෂණ ප්‍රශ්ණ ගැන ක්‍රමිකව නිරතුරුව අඛණ්ඩව විමර්ශන කිරීම ද; පුස්තකාල සේවා පරමාර්ථ නිශ්චය කිරීම ද; සිය රටෙහි ඇති පුස්තකාල සම්පත් උපයෝගී කොට එම පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා නියමිත කාලපරිච්ඡේදයන් නිශ්චය කර ගැනීමද පුස්තකාල සේවා සැලසුම් කිරීමෙන් අපේක්ෂා කෙරේ." ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සේවය ද මෙයම වේ.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, පළාත්පාලන හා අධ්‍යාපනික ආයතන ආදී විවිධ ආයතනයන් මගින් පවත්වාගෙන යනු ලබන නොයෙක් තරාතිරමේ පුස්තකාල ලංකාවෙහි ඇත. එහෙත් මේ දිවයිනෙහි සීඝ්‍රයෙන් අධිකවන උගත් ජනතාවට විශේෂයෙන්ම

විද්‍යාව අතින් උගත්කම ලැබූ අයගේ පරිහරණය සඳහා මෙම පුස්තකාල අතුරින්, එක් එක් වශයෙන් ගත්විට, අතළොස්සක හැර, සෙසු පුස්තකාලයන්හි ඇති සේවා සම්පත් ප්‍රමාණ නොවේ. නූතන අවශ්‍යතා අනුව මෙම පුස්තකාලයන්හි ඇති ග්‍රන්ථ සම්පත් වර්ධනය කිරීමත් දිනෙන් දින වැඩිවන පාඨක සංඛ්‍යාවට පුස්තකාලයාධිපතීන්ගේ උද්‍යොගීමත් සාමූහික ප්‍රයත්නයක් වශයෙන් පුස්තකාලයන්ගෙන් පිරිනැමෙන පාඨක සේවා දියුණු කිරීමත් ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රයත්නය වේ. අන් අයුරකින් කිවහොත්, පණ්ඩිතවර්ගයට පමණක් සීමාසහිත ස්වරූපයක් දැරූ අක්‍රියාකාරී පුස්තකාල සේවය උත්කර්ෂවත්, ව්‍යාප්ත ජනකාන්ත ස්වරූපයක් ගැන්වීමයි. 1970 මැයි මාසයේදී ආරම්භ කළ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පරමාර්ථ සමුදයාර්ථයෙන් මේවායි.

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ප්‍රකාශ කරනු ලබන "පුස්තකාල ප්‍රවෘත්ති" නම් වූ ප්‍රවෘත්ති සන්දේශය වූ කලී පුස්තකාල මණ්ඩලයෙන් ඉටුවන කටයුතු හා එහි පරමාර්ථයන් සාධනය කර ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියා මාර්ගයන් ලංකාවේ හා විදේශීය පාඨක ජනතාව වෙත ඉදිරිපත් කරන ප්‍රවෘත්ති මාධ්‍යයයි. මෙරට පුස්තකාල සේවාවන්ට අදාළ වන විදේශීය තොරතුරුද මින් සපයන්නට බලාපොරොත්තු වෙයි. විශේෂයෙන් ලංකාවේ පුස්තකාලයාධිපතීන්ට තම තමන් දැන හඳුනා ගැනීමට අගනා මණ්ඩපයක් ද විය හැක.

පුස්තකාල මණ්ඩලයේ සභාපති වශයෙන් මෙම ප්‍රවෘත්ති සන්දේශය ජනතාවට ඉතා සතුටින් හඳුන්වා දෙමි. එමෙන්ම මෙයින් ලංකාවේ පුස්තකාලයාධිපතීන් සම්පූර්ණ ප්‍රයෝජන ගන්නා ලෙස ද හිතාධ්‍යාශයෙන් ආරාධනා කරමි.

ජාතික පුස්තකාල සේවයක්, විශේෂයෙන්ම දියුණු වන රටක සමාජයීය හා ආර්ථික සංවර්ධනයෙහි ලා, පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැලකීමට හේතු ඉතා පැහැදිලිව සාරගර්භ කොට යුනෙස්කෝ ආයතනයෙහි පුස්තකාල ලේඛනාගාර හා ප්‍රලේඛන සේවා අංශයෙහි අධ්‍යක්ෂව සිට විශ්‍රාම ලත් සී.වී. පෙන්නා මහත්මයාණන් විසින් ප්‍රකාශිත පහත සඳහන් වචන ස්වල්පයට මෙම පණිවිඩය අවසන් කරන්නට පෙර අපගේ පාඨකයන්ගේ අවධානය යොමු කරවන්නට කැමැත්තෙමි.

> " ජාතික හා විශ්ව විද්‍යාල පුස්තකාල රටක උගත්කමට මාපක යන්ත්‍රයක් වේ නම්, රටක පොදු සංස්කෘතිය මැනීමේ යන්ත්‍රය මහජන පුස්තකාලය වේ. උගත්කම හා සංස්කෘතිය අගනා ජාතික සම්පත්ය. එසේ හෙයින් ආර්ථික හා සමාජයීය දියුණුව ශීඝ්‍ර කරලීම සඳහා පුද්ගලයාගේ අධ්‍යයනයට හා පුහුණුවට ප්‍රමුඛ ස්ථානයක් දීම හැම සංවර්ධන සැලැස්මෙහි හෝ වේවා අධ්‍යාපනික සැලැස්මෙහි හෝ වේවා අවශ්‍යතාවක් ලෙස ගැනේ. මනුෂ්‍ය සංහතියක් බහුශ්‍රුත වීමට හා සභ්‍ය වීමට ප්‍රධාන හේතුවක් නම් සවිලවත් අධ්‍යාපන ක්‍රමයකි. අධ්‍යාපන ක්‍රමයක් ඵලදායී වීමට ක්‍රමවත් ලෙස උපයෝගී කරගත් කියවීමේ

පුරුද්ද අවශ්‍ය වේ. කියවීමට පොත් අවශ්‍යය. මෙම පොත් සකළ ජනතාවට ලැබෙන සේ සැලැස්වීමට නම් පුස්තකාල අවශ්‍ය වේ. පුස්තකාල නොමැතිව මනා ප්‍රාථමික පාඨශාලා හෝ විශිෂ්ඨ ද්විතිය පාඨශාලා හෝ ශ්‍රෙෂ්ඨ විශ්ව විද්‍යාල හෝ වැඩි හිටියන්ට අවශ්‍ය අඛණ්ඩ ඒකාබද්ධ අධ්‍යාපනය හෝ ඇති වන්නට නුපුළුවන.

ජාතික අධ්‍යාපන සැලැස්ම හා මේ නයින් ජාතික ආර්ථික හා සමාජයීය සංවර්ධන සැලසුම් ක්‍රම හා ඒකාබද්ධ වූ මනාලෙස සංවිධානය කරන ලද ජාතික පුස්තකාල ක්‍රමයක් වූ කලී අධ්‍යාපනය හා පර්යේෂණයන් සම්බන්ධයෙන් ආයෝජනය කොට ඇති මුදල් ලාභ ප්‍රයෝජන ඇති වන සේ සාර්ථක ලෙස යොදා ඇති බවට සහතිකයකි. ඒ අනුව, අධ්‍යාපනයට මෙන් පුස්තකාල සේවාවන් සඳහා යොදන මුදල් පරිභොජනය පිණිස යෙදූ වැය ශීර්ෂයක් ලෙස නොව ස්ථාවර රක්ෂණයක් ලෙස යෙදූ මූල ධනයක් යැයි සැලකිය යුතුය.''*

අත්සන් කළේ/ව.මෙ.අ.වර්ණසූරිය,
ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති.

* සී.වී.පෙන්නා - පුස්තකාල සේවා සැලසුම් කිරීම. පැරිසිය, යුනෙස්කෝ, 1967.

## මහජන පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙළ - 1973.

රට පුරා පැතිරී ගිය මහජන පුස්තකාල හා පාඨශාලා පුස්තකාල ඇතුළත් වූ ජාතික පුස්තකාල සේවයක් ලංකාවෙහි ඇති කිරීමට සහායවීම ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අරමුණකි. මහනුවර, මාතලේ, කෑගල්ල යන ප්‍රදේශයන්හි නියාමක පුස්තකාල සේවයක් 1972 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙයට අනුකූලව මෙම පස් වසර තුළදී සෙසු ප්‍රදේශයන්හි ද ජාතික පුස්තකාල සේවය ව්‍යාප්ත කරනවා ඇත. මෙම වැඩ පිළිවෙළ අනුව 1973 වර්ෂයේ අදියරට ගාල්ල, අනුරාධපුරය, අම්පාර - කල්මුණේ යන ප්‍රදේශ තුන විශේෂයෙන් ඇතුළත් වේ. ඒ අතරම සෙසු ප්‍රදේශයන්හි ඇති ස්වෝත්සාහයෙන් සංවිධානය කළ මණ්ඩලයෙන් ආධාර ලැබීමට සුදුසු වූ පුස්තකාල වලට ද මණ්ඩලය සහාය වේ.

1973 වර්ෂයට තෝරා ගෙන ඇති දිස්ත්‍රික්ක තුන ජනාකීර්ණ වුව ද පැතිරී ගිය කෘෂිකර්ම ව්‍යාපාරයන්ගෙන් බහුල වුවද ඒවායේ අවශ්‍යතා සඳහා පුස්තකාල පහසුකම් අතින් නම් ඉතා දුර්වලය. මෙම ප්‍රදේශයන්හි මහජන පුස්තකාල ව්‍යාප්ත කිරීමට සරිලන වැඩ පිළිවෙළක් ගැන පළාත් පාලන දෙපාර්තමේන්තුව සමග පුස්තකාල මණ්ඩලය සාකච්ඡා කොට මැතිවරණ කොට්ඨාසයකට ආදර්ශ මහජන පුස්තකාලය බැගින් සංවර්ධනය කිරීම යෝග්‍ය යැයි සලකන ලදී. මේ අනුව එම මැතිවරණ කොට්ඨාසයන් නියෝජනය කරන මැතිවරුන්ගෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විචාරා මැතිවරණ කොට්ඨාස යකට එක පුස්තකාලය බැගින් තෝරාගෙන එම ලේඛනය පළාත් පාලන කොමසාරිස්තුමාට ඉදිරිපත් කරන ලදී. පුස්තකාල මණ්ඩලයේ සහාය හා අවධානය පිණිස එම ලේඛනය පළාත් පාලන කොමසාරිස්තුමා විසින් පුස්තකාල මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත.

මේ අනුව තෝරාගෙන ඇති මහජන පුස්තකාලවලට පළාත් පාලන දෙපාර්තමේන්තුව ප්‍රාග්ධන වියදම් සඳහා දීමනා වශයෙන් රුපියල් දෙලක්ෂයක් 1973 වර්ෂයේදී වැය කරන්නට අදහස් කරයි. මෙම පුස්තකාලවලට පොත්පත් සැපයීම හා පුස්තකාල සේවක පිරිසට වෘත්තිය පුහුණුවක් දීමට පුස්තකාල සේවා මණ්ඩලය සහාය වෙයි. පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ස්වකීය ප්‍රදේශයෙහි ඇති මෙම තෝරා ගත් පුස්තකාල ඒකකයක් වශයෙන් එකමුතු කරන අතර, එකී එකී පුස්තකාලයෙන් තමන්ගේ වසමට අයත් ප්‍රජා මණ්ඩලවලට පොත් පෙට්ටි මාර්ගයෙන් පොත් සැපයීමෙන් පුස්තකාල සේවය හැම ගමක් මුළුල්ලේ ව්‍යාප්ත කෙරේ. මෙම ග්‍රාමීය පුස්තකාල සේවයෙහි වගකීම එකී එකී පළාත් පාලන ආයතනය පිට රඳා පවතී.

අම්පාරේ දිසාපතිතුමා විසින් අම්පාරේ නගරයෙහි අභිනවයෙන් පිහිටුවන ලද මහජන පුස්තකාලය 1973 ජනවාරි මස 31 වැනිදා පළාත් පාලන උප ඇමතිතුමා විවෘත කළේය. රුපියල් තුන්දහසක් වටිනා පොත් තොගයක් දීමෙන්ද, එහි පුස්තකාලාධිපතිට වෘත්තීය පුහුණුවක් සැලසීමෙන් ද පුස්තකාල මණ්ඩලය සහාය දිනි. ගල්ඔය මීටියාවත මෙතෙක් පළාත් පාලන ආයතන ඇති ප්‍රදේශයක් නොවූයෙන් මෙම ප්‍රදේශයෙහි ආරම්භ කළ මහජන පුස්තකාල සේවයේ සංවර්ධන වැඩ පිළිවෙළ හා ව්‍යාප්තිය දිසාපති තුමන්ගේ පාලනය පිට රඳා පවතී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය හා කහටගස්දිගිලිය නගර සභාවන්හි අළුත් පුස්තකාල ගොඩනැගිලි ඉදිකොට ඇත. පුස්තකාල කටයුතු සඳහා අනුරාධපුර ප්‍රදේශයත් සමග යා කෙරෙන වවුනියාවෙහි රුපියල් ලක්‍ෂයකටත් වඩා වැය කොට ලංකාවේ මහජන පුස්තකාල අතුරින් ඉතා රමණීය එකක් ලෙස සැලකිය හැකි පුස්තකාල ගොඩනැගිල්ලක් තනා තිබේ. පසුගිය වර්ෂයේදී පුස්තකාලයට පොත්පත් ගැනීම සඳහා වවුනියා නගර සභාවෙන් රුපියල් 25,000/= ක් වැය විය. රුපියල් ලක්‍ෂ හතරකට වඩා වියදම් කොට අනුරාධපුරයෙහි තැනෙන මහජන පුස්තකාල ගොඩනැගිල්ල මෙම වර්ෂය ඉකුත් වන්නට පෙර සම්පූර්ණ කරන ලෙස පුස්තකාල මණ්ඩලය විසින් අනුරාධපුර සංරක්‍ෂණ මණ්ඩලය උනන්දු කරවන ලදී. මෙහි ඉතිරි වැඩ කොටස නිම කිරීමට කොන්ත්‍රාත් දී තිබේ. දැනට පරණ නගරයෙහි තදබද වූ ගොඩනැගිල්ලක ඇති මහජන පුස්තකාලය වැඩ අවසන් වූ වහාම මෙම අභිනව ගොඩනැගිල්ලට අනුරාධපුර සංරක්‍ෂණ මණ්ඩලය ගෙන යනු ඇත. එවිට මුළු උතුරු මැද පළාතට කියවීමට පොත පත සපයන ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාලයක් මෙම පුස්තකාලයේ අංශයක් වශයෙන් අනුරාධපුර සංරක්‍ෂණ මණ්ඩලයේ සහයෝගය ඇතිව පවත්වාගෙන යෑමට ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය අදහස් කරයි.

----------

ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,991 - 1971 දෙසැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 1971.12.30

1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත
16අ වගන්තිය යටතේ දැන්වීම.

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16අ වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාර පතිරගේ මාටින් පෙරේරා වන මම "ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය" එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා
මුදල් ඇමති.

1971 දෙසැම්බර් 17 වැනි දින,
කොළඹදී ය.

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

(වර්ෂ 1970 අංක 17 දරණ පනතින් සංස්ථාපිතයි)

1971 දෙසැම්බර් මස 30 වැනි දින නිකුත් වූ අංක 14,991 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ වූ 1971 දෙසැම්බර් මස 17 වැනි දින හා අංක 12,1092 දරණ ගරු මුදල් ඇමතිතුමාගේ නිවේදනය අනුව "ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය" දේශීය ආදායම් බදු පනතේ 16(අ) වගන්තිය යටතේ පිළිගත් පුණ්‍යායතනයක් බව දන්වා තිබේ.

මෙවැනි පිළිගත් පුණ්‍යායතනයක අභිවෘද්ධිය හා කටයුතු පිණිස සිය ධනයෙන් හෝ දේපල වලින් යම් පරිත්‍යාගයක් කරන තැනැත්තෙකුට දේශීය ආදායම් බදු පනත යටතේ, යට දැක්වෙන බදු සහන ලැබෙනවා ඇත.

(I) රුපියල් 500/= කට නොඅඩු මුදලක් පරිත්‍යාග කළවිට, පරිත්‍යාග කරන ලද මුදලින් භාගයක් හෝ, පරිත්‍යාග කරන්නාගේ තක්සේරු ආදායමෙන් විස්සෙන් කොටසක් හෝ, රුපියල් 25,000/= ක් හෝ, යන මෙයින් අඩු යැයි සැලකෙන මුදල් ප්‍රමාණයක් ඔහුගේ තක්සේරු වන ආදායමෙන් අඩු කරනවා ඇත.

(II) යම් පුද්ගලයෙකු විසින්, සිය ජීවිත කාලය තුලදී රුපියල් 1,000 කට වඩා වටිනාකමක් ඇති, සිය ධනයෙන් හෝ දේපලවලින් යම් පරිත්‍යාගයක් මෙම මණ්ඩලයට කරන්නේ නම් එසේ කරන ලද පරිත්‍යාග ප්‍රමාණය, දේශීය ආදායම් පනතේ 41(1) වගන්තිය යටතේ තෑගි බද්දෙන් නිදහස් වෙනවා ඇත.

(ඔහුගේ ජීවිත කාලය තුලදී මෙසේ
පරිත්‍යාග කළ හැකි උපරිම ධන
ප්‍රමාණය රු: 3,00,000 ක් වේ.)

මේ අනුව යම් පුද්ගලයෙකු විසින්, ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පිළිගන්වන පරිත්‍යාගයක් වේ නම්, එම පරිත්‍යාගයන් ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිතුමා වෙතට මුදලින් හෝ, චෙක්පතකින් හෝ, තෑගි ඔප්පුවකින් හෝ දිය යුතුය. ඒ සම්බන්ධව එවන සියළුම ලිපි; "සභාපති, ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, අංක 10, වෙල්සි උද්‍යානය, කොළඹ - 3". යන ලිපිනයට එවිය යුතුය.

මෙසේ ලැබෙන සියළුම පරිත්‍යාගයන් භාරගත් බවට සහතිකයක් ම විසින් නිකුත් කරනවා ඇත. මෙම සහතිකය, ප්‍රදාතය කරන්නාගේ වාර්ෂික ආදායම් වාර වාර්තාවට අමුණා එය දේශීය ආදායම් කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත දැක්වෙන බදු සහන ඔහුට/ඇට ලබාගත හැකි වනු ඇත.

ව.මෙ.අ.වර්ණසූරිය,
සභාපති,
ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

10, වෙල්සි උද්‍යානය,
කොළඹ - 3.

## ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සේවය.

(පළාත් පාලන කොමසාරිස්, ඒ.වී.එස්.ද අල්විස්.)

ශ්‍රී ලංකාවේ ආදි යුගය පිළිබඳ ඓතිහාසික ග්‍රන්ථවල අනේකවිධ ස්ථාන යන්හි, (සාමාන්‍යයෙන් ආරාමයන්හි පිහිටුවා තුබූ) මහජන පුස්තකාල පිළිබඳව සටහන් වී ඇත. මෑත යුගයේ මුල්ම මහජන පුස්තකාලය වූයේ 1813 වර්ෂයේ පිහිටු වන ලද "ඒකාබද්ධ සේවා පුස්තකාලය" යි. ඉන් වසර කිහිපයකට පසුව "කොළඹ පිටකොටුවේ පුස්තකාලය" පිහිටුවන ලදී. වර්තමාන කොළඹ මහජන පුස්තකාලය බිහි කරනු වස් 1925 වැන්නේදී මෙම පුස්තකාල දෙක ඒකාබද්ධ කෙරිණ.

අද මහජන පුස්තකාල සංවිධානය හා පැවැත්වීම පළාත් පාලන ආයතන වලට ඉඩදුන් කටයුත්තක්ව ඇත. දිවයිනේ 674 ක් වන පළාත් පාලන ආයතන අතුරෙන් 496 ක්ම පුස්තකාල පවත්වාගෙන යති. මේ හැම පුස්තකාලයක්ම නවීන ක්‍රමයට සංවිධානය කළ මහජන පුස්තකාල වශයෙන් විස්තර කළ නොහැක. මහජන පුස්තකාලයක කේන්ද්‍රස්ථානයක් නොමැති පළාත් පාලන ප්‍රදේශ 178 ක් තවමත් තිබේ. මහජන පුස්තකාල සම්පාදනය මහ නගර සභා හා නගර සභා මත පැවරුණු අනිවාර්ය යුතුකමක් කරනු වස් නීතිය සංශෝධනය කිරීම පිළිබඳව පළාත් පාලන අමාත්‍යාංශයේ සැළකිල්ල යොමු වී තිබේ. එබඳු විධිවිධාන සුළු නගර සභා හා ගම්සභා කෙරෙහිද ක්‍රමයෙන් ව්‍යාප්ත කරනු ලැබේ.

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පස් අවුරුදු සැලැස්මෙන්, අසම්පූර්ණ ප්‍රදේශ 178 හි ගොඩනැගිලි ඉදිකිරීමට බලාපොරොත්තු වේ. තවද දැනට පවත්නා පුස්තකාල ගොඩනැගිලි වැඩි දියුණු කිරීමට, පොත්-තොග සාරානුකූලව වර්ධනය කිරීමට හා පුස්තකාල කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට ද එයින් ඉඩ සැලසේ. 1973 වර්ෂයේ ආරම්භ වන I සැලැස්ම පිළිබඳ ආයෝජනය වර්ෂයකට රුපියල් 5,00,000/= ක් වේ.

විවිධ විෂයයන්, විශේෂයෙන් කෘෂිකර්මය හා කර්මාන්ත පිළිබඳව රජයේ නිලධාරීන්ට හා මහජනයාට තොරතුරු සැපයෙන පරිදි යම් යම් පුස්තකාල වල ලේඛන සම්පාදන මධ්‍යස්ථාන පිහිටු වීමටද අදහස් කොට තිබේ. යුනෙස්කෝ ආධාර ඇතිව මහනුවර ප්‍රදේශයේ ආරම්භ කරන ලද අත්හදා බැලීමේ ක්‍රමය පිළිබඳව විශේෂයෙන් මෙහිලා සඳහන් කළ යුතු වේ. මහනුවර ප්‍රදේශයේ පළාත් පාලන ප්‍රදේශ පහළොවක ජංගම පුස්තකාල සේවයක් ඇතුළුව මහජන පුස්තකාල සේවයක් පිහිටුවීමද මෙයින් කරනු ලැබේ. වර්ෂයක් පාසා ප්‍රදේශ දෙකක එබඳු අත්හදා බැලීමේ ක්‍රම ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

1970 පිහිටුවන ලද ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ එක් කාර්යයක් වනුයේ "මහජන පුස්තකාල සේවාවන් උසස් කිරීමෙහි හා වැඩි දියුණු කිරීමෙහිලා උප - දෙස් හා ආධාර දීම" යි. "පුස්තකාල අධ්‍යාපනය හා අභ්‍යාස සංවර්ධනය නඟා සිටුවීම" මණ්ඩලයේ තවත් කාර්යයකි. මහනුවර අත්හදා බැලීමේ ක්‍රමය සම්බන්ධයෙන් මණ්ඩලය පුළුල් ලෙස දැනටමත් ව්‍යාවෘත වී සිටී. මහජන පුස්තකාල සම්බන්ධයෙන් මණ්ඩලය වෙත පැවරී ඇති කාර්යද්වයය සපුරාලීමෙහි ලා පළාත් පාලන ආයතන සැම සහයෝගයක්ම දෙනු ඇත.

## මහජන පුස්තකාල සේවය

1971 - 72

| පළාත් පාලන ආයතන වර්ගය | එක් වර්ගයකින් ඇති ගණන | පුස්තකාල ඇති ආයතන ගණන | පුස්තකාල නැති ආයතන ගණන |
|---|---|---|---|
| මහ නගර සභා | 12 | 12 | 0 |
| නගර සභා | 36 | 34 | 2 |
| සුළු නගර සභා | 86 | 75 | 11 |
| ගම් සභා | 540 | 375 | 165 |
| | 674 | 496 | 178 |

1971 - 72 වර්ෂයට පුස්තකාල වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පළාත් පාලන ආයතනයන්ට කරන ලද දීමනා මුළු ගණන — රු: 300,000

| | |
|---|---|
| (1) පුස්තකාල ගොඩනැගිලි පහසුකම් සඳහා | රු: 180,000 |
| (2) පුස්තකාල පොත්පත් ගැනීම සඳහා | රු: 120,000 |
| | රු: 300,000 |

### පොත්පත් ගැනීම සඳහා පළාත්පාලන ආයතනයන්ට කළ දීමනා රු: 120,000 බෙදී ගිය අයුරු.

| | |
|---|---|
| නගර සභා එකකට ... ... ... | රු: 700 බැගින් |
| සුළු නගර සභා එකකට ... ... ... | රු: 500 බැගින් |
| ගම් සභා එකකට ... ... ... | රු: 170 බැගින් |

1973 වර්ෂයට පුස්තකාල වෙනුවෙන් පළාත්පාලන දෙපාර්තමේන්තුව විසින් පළාත්පාලන ආයතනයන්ට වෙන් කිරීමට අදහස් කරන දීමනා — රු: 500,000

| | |
|---|---|
| (1) පුස්තකාල ගොඩනැගිලි පහසුකම් සඳහා | රු: 180,000 |
| (2) පුස්තකාල පොත්පත් ගැනීම සඳහා | රු: 120,000 |
| (3) අනුරාධපුරය, ගාල්ල, අම්පාර/කල්මුණේ දිස්ත්‍රික්ක වෙනුවෙන් විශේෂ දීමනා | රු: 200,000 |
| | රු: 500,000 |

## පාසැල් පුස්තකාලය.

ආචාර්ය පී. උඩගම, (එම්. ඒ. පී. එච්. ඩී.)
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.

අධ්‍යාපනයේ නූතන පරමාර්ථය 'ඉගෙන ගැනීමට ඉගෙන ගැනීම' නම් අපේ ඉගැන්වීමේ වැඩ සටහන් හා ඒ සඳහා ඇති භාණ්ඩද පිළිබඳව අලුතින් සලකා බැලිය යුතුමේ. ඕනෑම අධ්‍යාපන ක්‍රමයක, වඩාත්ම අපේ ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන්නාවූ රටක දළ ජාතික නිෂ්පාදිතය ගැන සලකන කල්හි අධ්‍යාපනය සඳහා දරන්නා වූ ඉහළ වියදමක් ඇති විටකදීත් එක් බාධකයකයක් නම් අධ්‍යාපනය සඳහා මුදල් යෙදවීමය. අපේ ප්‍රශ්ණ බොහෝය; අපේ සම්පත් ඉතා සීමිතය.

නොයෙක් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සමග පාසල් පුස්තකාල අමතක වී තැත. ළමා අධ්‍යාපනය වඩාත්ම ඔහු වසන සමාජයට සම්බන්ධිතවූත්, අර්ථ සහගතවූත් දෙයක් කිරීමට නම් පාසැල් පුස්තකාල සම්බන්ධයෙන් අපේ ඇති ආකල්පය වෙනස් විය යුතුය. අපේ පාසැල් පුස්තකාල, පොත් ආරක්ෂා කොට තිබූ විශේෂ පුද්ගලයින් කණ්ඩායමක් විසින් පරිහරණය කළ පැරණි වර්ගයේ පොත් ගුල් ලෙස තැබීමට නොහැකිය. පාසල් පුස්තකාලය ඉගෙන ගැනීමේ මධ්‍යස්ථානයක් විය යුතුය. එමෙන්ම එය අපේ ශිෂ්‍යයින්ට සේවා මධ්‍යස්ථානයක් විය යුතුය. ඉගෙන ගැනීම එය වියයුතු පරිදිම පෞද්ගලිකව ලබාගත යුත්තක් නම්, අපේ විෂය මාලාවෙහි පුස්තකාලයට විශාල තැනක් හිමිවේ. සිංහල හා දෙමළ පාසල් දරුවන් සඳහා පෝ විශාල සංඛ්‍යාවක් නොමැති අපේ වැනි ජාතියකට නිසැකවම මෙය එසේමය.

අලුත් පොත්, අලුත් දැනීම හා ඒ දැනීමට අදාල ආශ්‍රය ග්‍රන්ථ අගය කිරීමට අපේ ළමුන්ට මඟ පෙන්වීමට ගුරුවරයාට හා පාසැල් පුස්තකාලයාධිපතිවරුන්ට සිදුවේ. ගුරුවරයකු සාමාන්‍ය පාඩමකින් නෙහෙට්ටු වූ විට පුස්තකාලය නිශ්ශබ්ද කියවීම සඳහා ළමුන් යවන තැනක් විය නොයුතුය. ඉගෙන ගැනීමේ හා පොත් හා උදව් ලබාදීමේ මධ්‍යස්ථානයක් වශයෙන් පුස්තකාලය ශිෂ්‍යයින් අද්දවා ගත යුතුය.

මීට අවුරුදු කීපයකට ඉහතදී ඇමෙරිකා එක්සත් ජනපදයේ කරන ලද සමීක්ෂණයකදී සියයට හැත්තෑ පහක් පමණ උසස් පාඨශාලා ශිෂ්‍යයින් පාසල් පුස්තකාලයට වඩා මහජන පුස්තකාලයට කැමැත්ත දැක්වූ බව හෙළිවිය. සමහරවිට එහි වඩා සම්පත් තිබෙන්නට පුළුවන. එමෙන්ම එය වඩා ආකර්ශණීයවූත් උදව් ලබාගත හැකිවූත් තැනක් වූවා විය හැකිය.

තම ඉගැන්වීමේ සැලසුම් සංවිධානය කිරීම සඳහා විෂය මාලා භාණ්ඩ මධ්‍යස්ථානය ලෙස පාඨශාලා පුස්තකාලය ගුරුවරයා විසින් සැලකිය යුතුය. පුස්තකාලය විෂය මාලා භාණ්ඩවල මධ්‍යස්ථානය ලෙස සකස් කිරීමට නොයෙක් ඒජන්සිවල නිරතුරුව බලා ගැනීමත් ආධාරයත් සහයෝගයත් අවශ්‍ය වේ.

වෘත්තීය පුහුණුව ලත් පුස්තකාලයාධිපතිවරයකු යටතේ මනාව පාලනය කරන ලද පාසැල් පුස්තකාලයකින් ලබාදිය හැකි සේවාවන් බොහෝය. පුස්තකාලය නව අදහස් ඇති කරවන, කියවීමට හා පොත්වලට ආශාවක් ඇති කරවන, සිය අධ්‍යාපන පටිපාටිය අභියෝගිකාරී ක්‍රියාවක් ලෙස අඟවන හා නිරතුරුවම ළමයාගේ සිත් ඇදගන්නා වූ තැනක් විය යුතුය.

ඉතා සුලු වශයෙන් වුවත් මෙවැනි මධ්‍යස්ථානයක් ඇති කිරීම ප්‍රධානාචාර්යතුමාගේ හා ගුරු මණ්ඩලයේ උදෙයෝගය හා ශිෂ්‍යනායකත්වය මත රඳා පවතී. ශිෂ්‍ය පාඨකයනට හොඳින් සේවයක් සලසනු ලබන පාඨශාලා පුස්තකාලය ඉගෙනීමේ මධ්‍යස්ථානයකි.

## ඒකාබද්ධ පුස්තකාලයාධිපති සේවය.

රජයේ කාර්යාංශ, සංස්ථා, පළාත් පාලන ආයතන, අධ්‍යාපනික ආයතන ආදියෙහි ඇති විවිධ පුස්තකාල සේවාවන්ගෙන් ඉටුවන සේවය ශීඝ්‍රයෙන් දියුණු වේගන යන අතර එම පුස්තකාල සේවාවන්හි නියුක්ත වූවන්ට ඇති වැටුප් ක්‍රම හා බඳවා ගැනීමේ කොන්දේසි ආදියෙහි ඇති විෂමතාවන්ද සැලකිය යුතු බැවින් මේ සම්බන්ධයෙන් දැන් පවත්නා තත්වය පරීක්ෂා කොට එයට කළහැකි පිළියම් ගැන රජයට කරුණු ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මූලික පියවර ගෙන ඇත. උද්‍යොගිමත් පුස්තකාල සේවයක් ඇති කරලීමට කාර්යක්ෂම වූද තෘප්තිමත් වූද පුස්තකාල සේවක පිරිසක් අවශ්‍යතම අංගයක් ලෙස පුස්තකාල මණ්ඩලය සලකයි.

මේ සම්බන්ධයෙන් පුස්තකාල වෘත්තිය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත වූ විශෙෂ කාරක සභාවක් පුස්තකාල මණ්ඩලය නොබෝදා පත් කළේය. පුස්තකාල සේවාවන්හි වැටුප් ක්‍රම හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් දැනට පවත්නා තත්ත්වය සමීක්ෂණය කිරීමද, රජයට ඉදිරිපත් කිරීමට මණ්ඩලය විසින් සලකා බලන සේ යෝජනා සම්පාදනය කිරීමද යන කාර්යයන් මෙම කාරක සභාවට පැවැරිණි.

පුස්තකාල සේවා සමීක්ෂණය සඳහා සැලකිය යුතු මහන්සියක් දරා මෙම විශෙෂ කාරක සභාව විසින් පුස්තකාල මණ්ඩලයට කෙටි වාර්තාවක් සපයන ලදි. මෙම වාර්තාව පරීක්ෂා කළ මණ්ඩලය, මෙහි ඇතුළත් ඇතැම් යෝජනා තව දුරටත් විමසිය යුතු බවට ද, මෙහි ඇතුළත් කරුණු අළලා මණ්ඩලයේ සභාපතිතුමා විසින් වාර්තාවක් සපයන ලෙසට ද, එසේ සකස් කළ වාර්තාව විශෙෂ කාරක සභාව විසින් නැවත නිරීක්ෂණය කොට මණ්ඩලයේ අනුමැතිය සඳහා එවන ලෙසට ද නිර්දේශ කළේය. ඉන්පසු රජයෙහි අවධානය පිණිස අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමට මණ්ඩලය අදහස් කරයි.

දැනට කරන ලද යෝජනාවන්හි ප්‍රධාන අරමුණු මේවා යි:

(1) ඒකාබද්ධ පුස්තකාලයාධිපති සේවයක් ඇති කරලීමේ අවියෙන්, විවිධ පුස්තකාල සේවාවන්ට හැකි තරම් දුරට සාධාරණ වන සේ, වැටුප් ක්‍රම හා බඳවා ගැනීමේ කොන්දේසි සකස් කිරීම;

(2) පුස්තකාලයේ ඇති සම්පත්, පුස්තකාලයෙන් කෙරෙන සේවය ආදි කරුණු අනුව පුස්තකාල ශ්‍රේණිගත කිරීම;

(3) පුස්තකාලයන්හි සැලකිය යුතු කාලයක් සේවය කොට ඇති පුස්තකාලයාධිපතීන්ට තවදුරටත් මෙරට හා පිටරට පුස්තකාල විද්‍යා පුහුණුව ලබා ගැනීමට හා පුස්තකාල විභාග ගැනීමට ඉඩ ප්‍රස්තා සැලසීම.

(මෙම ලිපියෙහි "පුස්තකාලයාධිපති" යන වචනය "පුස්තකාල නිලධාරී", "පුස්තකාල සේවක" යන අරුත් ද ගනී.)

## පාඨශාලා පුස්තකාල සංවිධානය හා සංවර්ධනය

විසිඅට ලක්‍ෂයක් ශිෂ්‍යයන් ඉගෙන ගන්නා නව දහසක් පාසැල්වලට ප්‍රමාණවත් පුස්තකාල සේවයක් සැපයීමට සැලසුම් කිරීම වූ කලී මහඟු ප්‍රයත්නයෙකි. ඇතැම් විට හැම පාසැලකටම පුස්තකාල ගොඩනැගිල්ලක් නොතිබෙන්නට පුළුවන; එහෙත් පාසැල් යන හැම ශිෂ්‍යයකුට පුස්තකාල සේවා පහසුකම් සැලසිය හැක. අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගෙන ඇති අර්ථවත් පියවර මෙම අභිමථාර්ථය මුදුන් පමුණුවා ගැනීමට ඉඟි කිරීමෙකි. එමෙන්ම ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් පාසැල් පුස්තකාල දියුණු කිරීමෙහි හා සංවර්ධනයෙහි ලා උපදෙස් දීම හා සහාය වීම නිසා මෙම ප්‍රයත්නයට මහත් රුකුලක් ලැබී ඇත.

පුස්තකාල මණ්ඩලයෙන් යෝජිත පරිදි පාඨශාලා පුස්තකාල සේවය සංවිධානය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ 1973 මුදල් ප්‍රතිපාදනයන්ට "පාඨශාලා පුස්තකාල සංවිධායක නිලධාරි" නම් වූ නව තනතුරක් අන්තර්ගත ය. ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල වලට ද "පුස්තකාල නිලධාරියකු" බැගින් අනාගතයේ දී පත් කිරීමෙන් හැම අධ්‍යාපන ප්‍රදේශයකම පාඨශාලා පුස්තකාල සේවය සංවිධානය හා සංවර්ධනයද ක්‍රමානුකූලව කළ හැක. ගුරු විද්‍යාල, දියුණු වූ පුස්තකාල ඇති මහා විද්‍යාල හා මාණ්ඩලික පුස්තකාලයන්ට පූර්ණ කාලීන පුස්තකාලයාධිපතිවරුන් බඳවා ගැනීම 1972 වර්ෂයේදී ශීඝ්‍රයෙන් වැඩි විය. 1973 වර්ෂයේදී ඇති අළුත් පත්වීම් හා ඇබෑර්තු පිරවීම් සඳහා පුස්තකාල විද්‍යාවෙහි පුහුණු වූ අයැදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇත්තේදැයි සැක සහිතය. දියුණු කිරීම සඳහා වර්ෂ යෙන් වර්ෂය තෝරා ගන්නා ඉතිරි මහා විද්‍යාල හා කණිෂ්ඨ විද්‍යාල විශාල සංඛ්‍යාවට පුහුණු වූ ගුරු - පුස්තකාලයාධිපතීන් පත් කිරීම ද කරගත යුතු ලැබේ.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, කණිෂ්ඨ විශ්ව විද්‍යාල හා රජයේ බහුතාක්ෂණික ආයතන මගින් පැවැත් වූ විභාගවලින් සමත් වූ අය පූර්ණකාලීන විදුහල් ප්‍රස්තකාලයාධිපතීන්ගේ තනතුරුවලට පත්කොට ඇත. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කළ ගුරු - පුස්තකාල යාධිපතීන්ගේ සේවා සඵ පුහුණුවීමේ පන්ති පුස්තකාල මණ්ඩලය විසින් පසුගිය දෙවර්ෂයේ දී පවත්වන ලදී. ගුරු අභ්‍යාස විද්‍යාලයන්හි "පාඨශාලා පුස්තකාල පරිපාලනය" නම් වූ පාඨමාලාවක් ආරම්භ කිරීමට අදහස් කොට තිබේ. ඉන් පසු පුහුණු වූ හැම ගුරුවරයකුට ගුරු - පුස්තකාලයාධිපති කෙනකු ලෙස සේවය කිරීමට ද හැකියාවක් ලැබේ. 1973 වර්ෂයේදී සිට විද්‍යාලංකාර විශ්ව විද්‍යාල මණ්ඩපයේ කලාවේදි විභාගයට "පුස්තකාල හා ප්‍රලේඛන විද්‍යාව" විෂයයක් ලෙස හදාරන්නට පුළුවන. මේ අනුව 1975 වර්ෂයේ සිට විශ්ව විද්‍යාලයෙන් අවුරුදු පතා පිටවෙන "පුස්තකාල විද්‍යාව" සහිත කලාවේදීන් විසි තිස්දෙනා අතුරෙන් කීප දෙනකු මහා විද්‍යාලයන්හි සේවයට පිවිසෙන්නට ද පුළුවන. මේ ආකාරයේ පාසැල් පුස්තකාලයන්හි සේවයට සුදුස්සන් විවිධ මාර්ගයන්ගෙන් අනාගතයේ දී ලැබෙනු ඇත.

පාසැල් පුස්තකාල දියුණු කිරීමෙහිලා පුස්තකාල මණ්ඩලය පසුගිය වර්ෂයේදී ගත් උත්සාහය යුනෙස්කෝ ආයතනයේ ආධාර ඇතිව මහනුවර ප්‍රදේශයේ ආරම්භ කළ නියාමක පුස්තකාල ව්‍යාපාරය කෙරෙහි යොමු විය. මෙම ප්‍රදේශයේ මාණ්ඩලික පුස්තකාල එකොළහක් දැනට සංස්කරණය කොට මෙම පාසැල් පුස්තකාල මගින් අසල්වැසි පාසැල්වලට පොත් බැහැර දීමෙන් පුස්තකාල සේවය ව්‍යාප්ත කෙරේ. මෙම මාණ්ඩලික පුස්තකාලවලට අවශ්‍ය පොත්, තාක්ෂණික උපකරණ හා සේවා උපදෙස් පුස්තකාල මණ්ඩලය සපයා ඇත.

මෙම ප්‍රදේශයේ තවත් පාසැල් පුස්තකාල කීපයක් ඉහත සඳහන් පුස්තකාලයන්ගේ තත්ත්වයට පැමිණේ.

ලංකාවේ හැම ප්‍රදේශයම එකවරට දියුණු කිරීමට අපහසු බැවින් වර්ෂයකට ප්‍රදේශ කීපයක විශේෂ දියුණුවක් ඇති කිරීම ද, ඒ අතරම සෙසු ප්‍රදේශයන්ට සාමාන්‍ය යෙන් සහාය වීමද මණ්ඩලයේ වැඩ පිළිවෙළයි. 1973 වර්ෂයේ පාසැල් පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙළට පුස්තකාල මණ්ඩලයේ විශේෂ අවධානය යොමුවන්නේ ගාල්ල, අනුරාධපුරය, කල්මුණේ - අම්පාර යන ප්‍රදේශයන්හි තෝරාගත් පුස්තකාලයන්ට ය. (මහජන පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙළම ද පුස්තකාල මණ්ඩලය මෙම පිළිවෙත අනුගමනය කරයි.) විශේෂ දියුණුව සඳහා එක මැතිවරණ කොට්ඨාසයකින් අඩු වශයෙන් එක පාසැල් පුස්තකාලයක් තෝරා ගනු ලැබේ. මෙම පුස්තකාලවලට අවශ්‍ය පොත් හා තාක්ෂණික ආධාර පුස්තකාල මණ්ඩලය සපයයි. අවශේෂ පාසැල් පුස්තකාලවලට මණ්ඩලයෙන් ආධාර ලැබෙන්නේ මණ්ඩලය වෙන් කොට ඇති අය ශීර්ෂයේ ප්‍රමාණයටත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයකුගෙන් සමන්විත වූ පුස්තකාල මණ්ඩලයේ පාඨශාලීය පුස්තකාල කාරක සභාවේ නිර්දේශයන්ටත් අනුවය.

---

අධ්‍යාපන අමාත්‍යාංශයේ පාඨශාලා පුස්තකාල සේවය

1967/68 සිට 1971/72 දක්වා පස් අවුරුද්ද

තුළ ප්‍රතිපාදිත මුදල් : පුස්තකාල පොත් හා වාර සඟරා සඳහා

| | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71 | 1971/72 (මාස 15) |
|---|---|---|---|---|---|
| මූලික අධ්‍යාපනය | 136,111 | 350,000 | 350,000 | 350,000 | 350,000 |
| ද්විතියික අධ්‍යාපනය | 243,152 | 400,000 | 400,000 | 300,000 | 303,000 |
| කාර්මික අධ්‍යාපනය | 67,317 | 100,000 | 100,000 | 150,000 | 150,000 |
| ගුරු අධ්‍යාපනය | 52,521 | 100,000 | 100,000 | 45,000 | 50,000 |
| එකතුව | 499,101 | 950,000 | 950,000 | 845,000 | 853,000 |

1973 වර්ෂයට ප්‍රතිපාදිත මුදල්

(I) පුස්තකාල පොත් හා වාර සඟරා සඳහා.

| | |
|---|---|
| මූලික අධ්‍යාපනය | රු: 280,000 |
| ද්විතියික අධ්‍යාපනය | රු: 245,000 |
| කාර්මික ආයතන, කෘෂිකර්ම, වාණිජ්‍ය | රු: 113,000 |
| ගුරු | රු: 60,000 |
| එකතුව | රු: 698,000 |
| දිළිඳු ළමයින් සඳහා නොමිලේ දෙන පොත් | රු: 225,000 |

(II) පාසැල් පුස්තකාලවලට ලීබඩු උපකරණ සඳහා රු: 434,000

සටහන් : අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික වැය ඇස්තමේන්තු ඇසුරෙනි.

## මහනුවර නියාමක ග්‍රාමීය පුස්තකාල සේවය.

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් පළාත්පාලන දෙපාර්තමේන්තුවේද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේද සහයෝගය ඇතිව ග්‍රාමීය නියාමක පුස්තකාල සේවයක් 1972 මැයි මාසයේදී මහනුවර ප්‍රදේශයේ ආරම්භ කරන ලදි.

මෙම නියාමක ව්‍යාපාරයට මහජන පුස්තකාල 21 ක්ද, පාඨශාලීය පුස්තකාල 24 ක්ද, වශයෙන් පුස්තකාල 45 ක් සහභාගී වේ. මේ සඳහා පුස්තකාල තේරීමේදී අඩු වශයෙන් එක මැතිවරණ කොට්ඨාසයකින් එක මහජන පුස්තකාලයක් ද, එක පාඨශාලා පුස්තකාලයක් ද බැගින් ඇතුළත් කිරීමට තීරණය කොට ඇත.

මෙම ව්‍යාපාරයට අවශ්‍ය මූල ධනය රජයෙන් ද, පොත පත හා පුස්තකාල උපකරණ යුනෙස්කෝ ආයතනයෙන් ද සපයා ඇත. උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසම විසින් මහජන පුස්තකාල බොහොමයක් තැනීමට වියදම් දරන ලදී.

ලංකාවේ අද දින පවත්නා ග්‍රාමීය පුස්තකාලයන්ගෙන් විශාල ගණනක් නොදියුණු තත්ත්වයක පවතී. එබැවින්, ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශයන්හි වඩාත් හොඳ පුස්තකාල සේවාවන් පැවැත්වීමට ඇති උග්‍ර අවශ්‍යතාව ඒත්තු ගෙන, මහනුවර ප්‍රදේශයෙහි නියාමක පුස්තකාල ව්‍යාපාරයක් ආරම්භ කිරීම කාලෝචිතයැයි ද සුදුසුයැයි ද ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සැලකුවේය.

නියාමක පුස්තකාල ව්‍යාපාරය යටතේ දියුණු කිරීමට තෝරාගත් පුස්තකාල පාඨකයන්ට උපරිම සේවය ලැබෙන සේ ප්‍රතිසංස්කරණය කෙරේ. මෙම කටයුත්ත සඳහා ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පහත සඳහන් කරුණු ගැන විශේෂ සැලකිල්ලක් දක්වනවා ඇත. එනම්:

(1) ජීවිතය සවලදායි වනසේ ගම්බද ජනතාවගේ විවේක කාලය ගත කිරීමේ ව්‍යාවෘතයක් වශයෙන් කියවීමේ පුරුද්දට ඇබ්බැහි කිරීම;

(2) පාසැල් හැර යාමෙන් පසු ස්වකීය අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාමට ගම්බද ජනතාවට අවස්ථාව සැලසීම;

(3) ස්වකීය කාර්මික ඥානය පුළුල් කර ගැනීමට කියවීමට අවශ්‍ය පොත පත ගම්බද ජනතාවට සැපයීම;

(4) පාසැලෙහි මෙන්ම ගමෙහිද දැනගතයුතු දේ සපයන ජනප්‍රිය මධ්‍ය ස්ථානය පුස්තකාලය කිරීම.

ඉහත සඳහන් කල අරමුණු සවල කරලීම සඳහා පුස්තකාල සේවා මණ්ඩලය පොත් පෙට්ටි මගින් පොත් සැපයීමේ සේවයක් ආරම්භ කොට ඇත. ගමේක දුරබැහැර ස්ථානයෙක ජීවත් වන අයට පවා මේ අයුරින් පුස්තකාල සේවා ලබා ගත හැක.

ප්‍රජා මණ්ඩලවලට අනුබද්ධ වූ පාඨක සමාජ ගම්සභා පුස්තකාලයේ පාඨකයන් ලෙස ලියාපදිංචිවීමෙන් පසු වරකට පොත් පතහ බැගින් ලබාගති. මෙම පොත් ට්‍රන්ක්

පෙට්ටිවල අසුරා ගම්සභා පුස්තකාලයෙන් ප්‍රජා මණ්ඩලවලට යැවේ. පාඨක සමාජයන්හි සාමාජිකයෝ මෙම පොත් ප්‍රජා මණ්ඩලයෙන් කියවීමට ලබා ගනිති. මෙම පොත් පරිශීලනය කොට අවසන් වූ විට සති දෙකකට පසුව හෝ මසකට පසුව හෝ මහජන පුස්තකාලයට ආපසු ගෙනවිත් දුන් පසු ප්‍රජා මණ්ඩලය වෙනත් පොත් කට්ටලයක් ලබා ගනී.

පාසැල් පුස්තකාල සම්බන්ධයෙන් නියාමක වැඩ පිළිවෙළ මෙසේය. මාණ්ඩලික මධ්‍ය පුස්තකාලයක් අවට අනුබද්ධව යැපෙන පාඨශාලා පුස්තකාල ගණනක් වේ. මෙම අතුරු පාසැල් පුස්තකාලවලට ස්වකීය අවශ්‍යතා අනුව පොත් කට්ටල පොත් පෙට්ටිවල අසුරා මණ්ඩලික පුස්තකාලයෙන් වරින්වර සපයනු ලැබේ.

මෙම නියාමක වැඩ පිළිවෙළට සම්බන්ධ වූ හැම පුස්තකාලයක්ම අවම පුස්තකාල අවශ්‍යතාවන් පිරිමැසෙන සේ සකස් වූවාට පසු පුස්තකාල සේවා මණ්ඩලය විසින් ආධාර වශයෙන් පොත් කට්ටලයක්ද ඇතැම් පුස්තකාල උපකරණ ද සපයනු ලැබේ. මෙම පුස්තකාලයන්හි පුස්තකාලයාධිපතිවරු සහ සෙසු පුස්තකාල සහායකවරුන්ට ප්‍රමාණවත් පුහුණුවක් නැත්නම් ඔවුනට පුස්තකාල මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය අංශයේදී පුස්තකාල විද්‍යා පුහුණුවක් ද දෙනු ඇත.

මෙම නියාමක ව්‍යාපාරයට සහභාගී වන පුස්තකාල 45 පහත සඳහන් ආකාරයට වර්ගීකොට ඇත.

මහජන පුස්තකාල - 21

නගර සභා - 1 | සුළුනගර සභා - 2 | ගම්සභා - 18

පාසැල් පුස්තකාල - 24

මධ්‍ය මහා විද්‍යාල - 4 | මහා විද්‍යාල - 16 | කණිෂ්ඨ පාසැල් - 4

## සැලකිය යුතු සිද්ධීන් හා වැඩ කටයුතු

### යුනෙස්කෝ ආයතනය හා පුස්තකාල මණ්ඩලය.

ආසියාවේ ජාතික පුස්තකාල සේවා සංවිධානය කිරීම සම්බන්ධයෙන් යුනෙස්කෝ ආයතනය විසින් 1967 දෙසැම්බර මාසයේදී කොළඹ පැවැත් වූ සම්මේලනය හා එහි අවසාන වාර්තාව (සීඕඑම්/සීඑස්/190/6, අප්‍රේල් 1967), වර්ෂ 1970 අංක 17 දරණ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පණත සකස් කොට නීතිගත කිරීමටත්, 1970 මැයි මාසයේදී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ස්ථාපිත කිරීමටත් වැදගත් ප්‍රමාණයකට ඉවහල් වූ බැව් මේ ගැන තතු දන්නෝ දනිති.

ආරම්භයේ පටන් පුස්තකාල මණ්ඩලයට යුනෙස්කෝ ආයතනය සමග ඉතා කිට්ටු ආශ්‍රයක් ඇත. යුනෙස්කෝ පුස්තකාල විශේෂඥවරිය වූ එව්ලින් ජේ. එවන්ස් මහත්මිය සහ 1970 – 71 දී පුස්තකාල මණ්ඩලයෙහි සභාපති වූ ඩී. ජී. සුගතදාස මහත්මයා, පුස්තකාල සේවා මණ්ඩල පණත සකස් කිරීමටද, මහනුවර ප්‍රදේශයේ නියාමක ග්‍රාමීය පුස්තකාල සේවය ආරම්භ කිරීමටද, ගම්පහ බණ්ඩාරනායක ආදර්ශ පුස්තකාලය දියුණු කිරීමටද උපස්ථම්භක වූහ.

යුනෙස්කෝ ආයතනයේ පුස්තකාල, ලේඛනාගාර හා ප්‍රලේඛන විද්‍යා අංශයේ අධ්‍යක්ෂ ආචාර්ය ඕ. ඒ. මිකයිලොප් මහතා 1972 මාර්තු මාසයේදී ලංකාවට පැමිණ පුස්තකාල මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශය හා පුස්තකාල ලේඛනාගාර කටයුතු පිළිබඳ අනිකුත් ආයතන යන්හි නිලධාරීන් සමග දෙදිනක සාකච්ඡා පැවැත්විය. ක්‍රම සම්පාදක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සමග පැවැත් වූ සාකච්ඡාවට පුස්තකාල මණ්ඩලයේ සභාපති සහ ලේකම් ද සහභාගී වූහ.

යුනෙස්කෝ ආයතනයේ විශේෂඥ ඇල්. ජ්. සමරසිංහ මහතා 1972 දෙසැම්බර මාසයේදී ලංකාවට පැමිණ පුස්තකාල මණ්ඩලයේ ද, විද්‍යා සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ද, ජාතික විද්‍යා සංගමයේ සහ ක්‍රම සම්පාදක අමාත්‍යාංශයේ ද නිලධාරීන් සමග ලංකාවෙහි විද්‍යා හා කාර්මික ප්‍රලේඛන මධ්‍යස්ථානයක් පිහිටුවීම ගැන ඒ මහතා විසින් යුනෙස්කෝ ආයතනය වෙනුවෙන් සම්පාදිත වාර්තාවේ නිර්දේශයන්ට අනුකූලව සාකච්ඡා පැවැත්විය. (වාර්තා අංකය: 1159/බීඑම්එස්/ආර්ඩී/ඩීබීඒ ;පැරිස් 1969).

1967 වර්ෂයේදී යුනෙස්කෝ ආයතනයේ මෙහෙයීමෙන් කොළඹ පැවැත්වූ පුස්තකාල විශේෂඥයින්ගේ අවසාන වාර්තාවේ නිර්දේශයන් අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, ජාතික ප්‍රලේඛන මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කළ යුතුය. ඒ වුවද, විද්‍යා හා කාර්මික ප්‍රලේඛන කටයුතු නොපමාව ආරම්භ කොට, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ක්‍රියාත්මක වූවාට පසු, මෙම ප්‍රලේඛන අංශය ජාතික පුස්තකාලය හා ඒකාබද්ධ විය යුතු යැයි ඉහත සඳහන් නිලධාරීහු එකඟ වූහ. ජාතික පුස්තකාලය පිහිටුවීම රජයෙන් පුස්තකාල මණ්ඩලයට පවරා ඇති ප්‍රධාන කටයුත්තක් බැවින් ජාතික පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ජාතික ලේඛනාගාරයට නුදුරුව නිදහස් චතුරශ්‍ර ප්‍රදේශයෙහි සුදුසු ඉඩමක් පවරන මෙන් පුස්තකාල මණ්ඩලය රජයට ආයාචනා කොට ඇත.

1971/72 වර්ෂ සඳහා යුනෙස්කෝ ආයතනයේ සාමාන්‍ය වැඩ පිළිවෙළ යටතේ ග්‍රාමීය පුස්තකාල නියාමක සේවයක් ලංකාවෙහි පටන් ගැනීමේ කාර්යය පුස්තකාල මණ්ඩලයට පැවැරිණි. (සංක්ෂිප්ත වාර්තාව සඳහා 15 වැනි පිටුවේ ලිපිය බලන්න). විදේශීය මහජන

හා පාඨශාලීය පුස්තකාල සේවාවන්හි පුහුණු කිරීම සඳහා පුස්තකාල මණ්ඩලයේ සහකාර අධ්‍යක්‍ෂවරුන් දෙදෙනෙකුට යුනෙස්කෝ ආයතනය විසින් ලක් රජයේ අනුමැතිය ඇතිව අධිශිෂ්‍යත්ව දෙකක් පිරිනමන ලදි.

1972 අන්තර් ජාතික ග්‍රන්ථ වර්ෂය නිමිත්තෙන් පුස්තකාල මණ්ඩලයේ සහභාගිත්වය කූට ගැන්වූයේ "ශ්‍රී ලංකා පුස්තකාල සේවා" නම් වූ ප්‍රදර්ශනයක් 1972 සැප්තැම්බර 29 සිට ඔක්තෝම්බර 3 වැනිදා දක්වා කොළඹ කලාගාරයේ උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමෙනි. පාඨශාලීය පුස්තකාල, මහජන පුස්තකාල, විශෙෂ පුස්තකාල, විශ්ව විද්‍යාල පුස්තකාල, විහාර පොත්ගුල් ආදි පුස්තකාල සේවාවන්ගේ ප්‍රගතිය ඡායාරූප හා අනිකුත් සටහන් මගින් මෙම ප්‍රදර්ශනයෙහි පිළිබිඹු විය. බ්‍රිතාන්‍ය කවුන්සලයෙන් සම්පාදිත "ඉන්දියාවේ සහ ලංකාවේ පාසැල් පුස්තකාලවලට සුදුසු පොත් පන්සියයක්" නම් වූ ග්‍රන්ථ ප්‍රදර්ශනයක් ද, අමෙරිකන් මධ්‍යස්ථානයෙන් ග්‍රන්ථ වර්ෂය නිමිත්තෙන් සකස් කළ "මුද්‍රණ ශිල්ප හා ප්‍රලේඛන විද්‍යා" නම් වූ ග්‍රන්ථ ප්‍රදර්ශනයක් ද මෙහි අගය දියුණු කළේය. අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, සංස්කෘතික දෙපාර්තමේන්තුව, ස්වභාෂා දෙපාර්තමේන්තුව, යුනෙස්කෝ ලංකා කොමිසම සහ ලංකා ග්‍රන්ථ ප්‍රකාශකයින්ගේ ආයතන "පුස්තකාල සේවා ප්‍රදර්ශනයෙහි" විශෙෂ අංශයක් වශයෙන් "නූතන ග්‍රන්ථ ප්‍රදර්ශනයක්" පැවැත්විය.

---

## ලංකාවේ පුස්තකාල විද්‍යා අධ්‍යාපනය ගැන අපේක්‍ෂා - 1973

පුස්තකාල අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ සංවර්ධනය දියුණු කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට රජයෙන් පවරා ඇති බලතල හා යුතුකම් අතුරින් එකක් වේ. මූලික-, මධ්‍යම- හා උසස් මට්ටමේ දැන් පවත්නා පුස්තකාල විද්‍යා අධ්‍යයන පාඨමාලා දියුණු කිරීමට හා අලුතෙන් වෙනත් පාඨමාලා ආරම්භ කිරීමට ද පුස්තකාල මණ්ඩලයේ අවධානය සෑහෙන ප්‍රමාණයකට යොමු කොට ඇත.

1961 වර්ෂයේදී ලංකා පුස්තකාල සංගමය ස්වකීය සාමාජිකයන් සඳහා පුස්තකාල විද්‍යා පන්ති ආරම්භ කළේය. 1961 වර්ෂයේ සිට ප්‍රාථමික විභාගය ද, 1966 වර්ෂයේ සිට ද්විතීය විභාගය ද වර්ෂයක් පාසා පැවැත්විණ. අවසාන විභාගය සඳහා පුහුණු වීමේ පන්ති මෙම වර්ෂයේ සිට ආරම්භ කොට ඇත. වැඩි විස්තර සඳහා විමසන්න: "අධ්‍යාපන නිලධාරි, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයීය පුස්තකාලය බාරේ, තැපැල් පෙට්ටිය අංක 1698, කොළඹ - 7."

1961 වර්ෂයේදී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය පශ්චාත් උපාධි ඩිප්ලෝමා පුස්තකාල විද්‍යා පන්තියක් ආරම්භ කළේය. ස්ථිර ගුරු මණ්ඩලයක් පත් කර ගැනීම් ආදි ඇතැම් අපහසුකම් නිසා එම පාඨමාලාව 1965 දී නතර කරන්නට සිදු විය. 1972 දී පුස්තකාල මණ්ඩලයත් පුස්තකාල සංගමයත් කළ ඉල්ලීම නිසා, ලංකාවෙහි පුස්තකාලවලට නුදුරු අනාගතයේදී අවශ්‍ය වන පුස්තකාලයාධිපතීන්ගේ සංඛ්‍යා ආදි කරුණුද සාධක කොට නැවත වරක් උපාධි හා පශ්චාත් උපාධි සඳහා පුස්තකාල හා ප්‍රලේඛන විද්‍යා පාඨමාලා ආරම්භ කිරීම සුදුසු යැයි ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය තීරණය කොට තිබේ. අවශ්‍ය ගුරු මණ්ඩලය පත් කළ වහාම ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයීය විද්‍යාලංකාර මණ්ඩපයෙහි පුස්තකාල

හා ප්‍රලේඛන විද්‍යා අංශයක් ආරම්භ වෙතැයි අපේක්ෂා කෙරේ.

කනිෂ්ඨ විශ්ව විද්‍යාලයන්හි පැවැත් වූ මධ්‍යම පරිමාණයේ ද්වි වාර්ෂික පුස්තකාල විද්‍යා පාඨමාලාව මුදල් හා ගුරු මණ්ඩල ලැබුණු විට රජයේ බහුතාක්ෂණික ආයතනයන්හි නැවතත් ආරම්භ කරනවා ඇත. ඒ අතර "පාඨශාලා පුස්තකාල පරිපාලනය" නම් වූ පාඨමාලාවක් ගුරු අභ්‍යාස විද්‍යාලයන්හි පැවැත්වෙන "අධ්‍යාපන I හෝ II" නැමැති පාඨමාලාවට ළඟදී ඇතුලත් කිරීමට අදහස් කෙරේ. මේ අනුව පුහුණු වූ ගුරුවරුන්ට පාඨශාලා පුස්තකාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වනවා පමණක් නොව විද්‍යාලයන්හි ගුරු-පුස්තකාලයාධිපතීන් වශයෙන් නියුක්ත වන්නටද පුළුවන.

රජයේ පුස්තකාලයාධිපතීන්ට සහ මහජන පුස්තකාලයාධිපතීන්ට දැනට පවත්නා රෙගුලාසි අනුව උසස් ශ්‍රේණීන්ට නැගීමට පලිබොධ ඇති හෙයින්, පුස්තකාල විද්‍යා විභාගවලට සකස් වීමට වගකිය යුත්තන් එම පුස්තකාලයාධිපතීන්ට ඉඩ ප්‍රස්තා සැලසිය යුතු යැයි රජයේ සහ මහජන පුස්තකාලයාධිපතීන්ගේ වෘත්තීය සංගම් කලෙක සිට ඉල්ලීම් ඉදිරිපත් කොට ඇත. ( 12 වැනි පිටුව බලන්න.)

පුස්තකාල විද්‍යා පුහුණුව දියුණු කිරීම සඳහා නොයෙක් විදේශ තානාපති කාර්යාල පුස්තකාල මණ්ඩලයටද අධ්‍යාපන අමාත්‍යාංශයටද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයටද සැලකිය යුතු ප්‍රමාණයෙක ආධාර දී ඇත. බ්‍රිතාන්‍ය කවුන්සලය සහ අමෙරිකා සංස්කෘතික මධ්‍යස්ථානය විශ්ව විද්‍යාලයට හා පුස්තකාල මණ්ඩලයට පුස්තකාල විද්‍යා කථිකාචාර්ය වරුන් හා උපදේශක වරුන් සැපයීමට ප්‍රතිඥා දී තිබේ. යුනෙස්කෝ ආයතනයේ පුස්තකාල ප්‍රලේඛණ විද්‍යා හා ලේඛනාරක්ෂක අංශය පුස්තකාල විද්‍යා අධ්‍යයන ක්‍රියා පටිපාටිවලට අවශ්‍ය දේශකයන් හා අවශ්‍ය පුස්තකාල උපකරණ සැපයීමට නිතරම ලැස්ති බැව් ප්‍රකාශ කොට ඇත. බ්‍රිතාන්‍ය රජයේ විදේශීය සංවර්ධන පරිපාලන ආයතනය බ්‍රිතාන්‍ය කවුන්සලයේ නිර්දේශයන් අනුව පුස්තකාල හා ප්‍රලේඛන විද්‍යාවන්ට අදාළ වූ අගනා ග්‍රන්ථ 200 ක් ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට නොමිලේ පරිත්‍යාග කළේය.

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/13
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ...

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*